# ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

## 2024 වසර සඳහා සැපයුම්කරුවන් / කොන්ත්‍රාත්කරුවන් ලියාපදිංචි කිරීම.

2024 වසර සඳහා ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පහත සඳහන් භාණ්ඩ /සේවා සැපයීම හා ඉදිකිරීම් සඳහා ලියාපදිංචි වීමට අපේක්ෂාකරන සැපයුම් කරුවන්ගෙන්/ නිෂ්පාදකයින්ගෙන් /දේශීය නියෝජිතයන්ගෙන් / බෙදාහරින්නන්ගෙන්/ කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

- එක් එක් භාණ්ඩ / සේවා / ඉදිකිරීම් උප කාණ්ඩ සඳහා ආපසු නොගෙවන රු.2000.00 ක මුදලක් ලියාපදිංචි ගාස්තු ලෙස ගෙවිය යුතුයි.

- ආපසු නොගෙවන රු.2000.00 ක ලියාපදිංචි ගාස්තුව මහජන බැංකුව ගංගොඩවිල ශාඛාවේ අංක 097-1-001-6-2315454 දරණ ගිණුමට හෝ අන්තර්ජාලය ඔස්සේ **www.sjp.ac.lk** වෙබ් අඩවිය හරහා ගෙවීම් සිදුකර එම රිසිට් පත අයදුම්පත් සමග අමුණා එවිය යුතුය. මුදල් අණකර (Money Order), බැංකු අණකර (Bank Draft) හෝ චෙක්පත් භාරනොගන්නා බව කරුණාවෙන් සලකන්න.

- ආදර්ශ අයදුම්පත් හා ආශ්‍රිත විස්තර ජයවර්ධනපුර විශ්වවිද්‍යාලීය වෙබ් අඩවිය ඔස්සේ බාගත කළ හැකිය. "www.sjp.ac.lk - Procurement and Notices".

- භාණ්ඩ/සේවා/ ඉදිකිරීම් උප කාණ්ඩ මුදල් ගෙවූ රිසිට් පත් සම්පූර්ණ කරන ලද අයදුම්පත්, පහත සඳහන් ලේඛනවල සහතික කරන ලද පිටපත් සමග ඉදිරිපත් කළ යුතුය.

    1. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ සහතිකය, සැපයුම්කරුවන්ගේ හා කොන්ත්‍රාත්කරුවන්ගේ ක්ෂේත්‍රවලට අදාළ අනෙකුත් බලපත්‍ර, සීමිත සමාගම් සඳහා සාංගමික සංස්ථා පත්‍රය සහ සාංගමික ව්‍යවස්ථාවලිය.

    2. අදාළ ක්ෂේත්‍රවල අවු. 03 ක පලපුරුද්ද (සනාථ කිරීමට අවශ්‍ය ලිපි ලේඛන එවිය යුතුය)

- සුදුසුකම් සපුරා නොමැති අයදුම්කරුවන් ලියාපදිංචි නොකරන අතර තැන්පතු ආපසු නොගෙවන බව කරුණාවෙන් සලකන්න. රජයේ දෙපාර්තමේන්තු/මණ්ඩල/සංස්ථා ඉහත ලිපි ලේඛන ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

- අයදුම්පත් ලියාපදිංචි තැපෑලෙන් 2023 නොවැම්බර් මස 30 වැනි දින ප.ව. 4.00 ට හෝ ඊට පෙර විශ්වවිද්‍යාලයේ සැපයුම් අංශයට ලැබෙන ලෙස එවිය යුතුය. ලියාපදිංචිය සඳහා අපේක්ෂා කරන උප කාණ්ඩය පැහැදිලිව අයදුම්පතේ සඳහන් කල යුතුය.

- මුදල් ගෙවූ රිසිට්පත් අයදුම්පත සහ අනිකුත් ලිපි ලේඛන සමග ලියුම් කවරයක බහා ලියුම් කවරයේ ඉහළ වම් කෙලවරේ "සැපයුම්කරුවන් ලියාපදිංචිකිරීම (උප කාණ්ඩ) 2024" ලෙස සඳහන් කර එවිය යුතුය.

- ඕනෑම අයදුම්පත්‍රයක් භාරගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. කිසියම් සැපයුම් කරුවෙකු මිල කැඳවීමකට අනුව නියමිත පිරිවිතරයන්ට, නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබාදීමට අසමත් වුවහොත් කලින් දැනුම් දීමකින් තොරව ලියාපදිංචිය අත්හිටුවීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුය. අසම්පූර්ණ අයදුම්පත් හා පෙර වර්ෂවලදී නියමිත පිරිවිතරයන්ට සහ නියමිත කාලයට භාණ්ඩ හෝ සේවා ලබාදීමට අසමත් වූ සැපයුම්කරුවන්ගේ අයදුම්පත් ලියාපදිංචියෙන් ඉවත් කරනු ලැබේ.

- ලියාපදිංචි සැපයුම්කරුවන්ගෙන් මිල කැඳවීම් ලබාගන්නා අතර තරඟකාරී මිල ගණන් ලබා ගැනීමේ අපේක්ෂාවෙන් වෙනත් සැපයුම්කරුවන්ගෙන් සහ promis.lk වෙබ් අඩවියෙන් මිල කැඳවීම් කිරීමේ අයිතිය විශ්වවිද්‍යාලය සතුවේ.

- ලියාපදිංචිවන සියලුම සැපයුම් හා කොන්ත්‍රාත් දින 30 ක අවම ණය කාලසීමාවකට යටත් විය යුතුය.
- වැඩිදුර විස්තර සඳහා සතියේ දිනවල කාර්යාලීය වේලාව තුලදී (පෙ.ව. 9.00 - ප.ව.3.30) නියෝජ්‍ය මූල්‍යාධිකාරි - සැපයීම් අංශයෙන් ලබා ගත හැක. (දු.ක. 0112758216/0112758217)

ලේඛකාධිකාරි
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල, නුගේගොඩ
2023.10.16